සියලු ම හිමිකම් ඇවිරිණි ]
முழுப் பதிப்புரிமையுடையது ]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்புகல்வி வலயம்
Western Provincial Education Department-Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணைமதிப்பீடு - 2016
Second Term Evaluation -

| | | |
|---|---|---|
| 11ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 | සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රය<br>சிங்கள மொழியும் இலக்கியமும்வினாத்தாள் -1<br>Sinhala Language & Literature Paper I | පැයකයි<br>நேரம் மணித்தியாலம்<br>One Hour |

සැලකිය යුතුයි :-

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (ඒ සඳහා ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න)
- මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

*** අංක 01 සිට 04 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වචනය තෝරන්න.**

(01) ගුරුතුමා සිය සිසුන් අමතා නිතර පැවසුවේ උගුරට **හොරා බෙහෙත් කෑම** නොකළ යුතු බවයි.

1. බෙහෙත් අවශ්‍යයෙන් ම බීමට ගැනීම
2. කැමැත්තෙන් හෝ ආශාවෙන් එය ඉටු කිරීම
3. බෙහෙත් නිසා ශරීර සෞඛ්‍යය හොඳ නොවීම
4. අකමැත්තෙන් යමක් කිරීම

(02) පුංචි රාළ **කටින් බතල කොළ සිටවන්නකු** ලෙස ගමෙහි ප්‍රසිද්ධියක් දරයි.

1. ප්‍රසිද්ධ ගොවියෙකු බව
2. කෙරුවාව හොඳ අයකු බව
3. කතාව මිස ක්‍රියාව නැති අයෙකු බව
4. ක්‍රියාව මිස වෙන කිසිවක් නොසොයන්නකු බව

(03) අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන් **අහසේ තරු ගනිමින් සිටීම** නොකළ යුතු බව ගුරුතුමිය පැවසුවා ය.

1. අසීරු වැඩක යෙදීම
2. තාරකා සංගමයට බැඳීම
3. නොකළ හැකි දේ ගැන සිතීම
4. අනාගතය ගැන නොසිතීම

(04) සිලිඳු සිරගතවීමට පෙර සෑම දිනක ම **මිටි තැනින් වතුර බසින බව** නිතර මුමුණමින් සිටියේය.

1. වැරදි කරන්නේ නිලධාරීන් බව
2. නිලධාරීන් වැරදි කළත් අසුනොවන බව
3. සියලු වැරදි දුබලයින්ට පැවරෙන බව
4. වතුර බැසීමට පොළව සමතලා විය යුතු බව

අ.පි.බ.

169

*** අංක 05 සිට 07 තෙක් ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.**

(05) සාහිත්‍ය විචාරක කාර්යයේදී විචාරාත්මක බස් වහරක් ................................ කිරීම ය.

1. ~~නිර්මාණය~~ 2. ~~පරිහරණය~~
3. විචාරණය 4. ආස්වාදනය

(06) ශේක්ස්පියර්, කවියෙකු දෘශ්‍ය කාව්‍ය රචකයකු ලෙස ලෝකය හමුවේ ......................... සේවයක් ඉටු කළේය.

1. අභිභවනීය වූ 2. අද්විතීය වූ
3. අවියෝජනීය 4. අතිපාරිශුද්ධ

(07) ජනකවියා සිය අත්දැකීම සැම විට ම ......................... යුතුව ඉදිරිපත් කරයි.

1. සංයමයෙන් 2. උපමාවෙන්
3. සංගමයෙන් 4. සංයතයෙන්

*** පහත කියමන් අතුරෙන් නිවැරදි වරණය තෝරන්න.**

(08)
1. ස්වර දෙකක් එක්වී සෑදෙන ස්වර "හ්‍රස්ව" ස්වර යි.
2. අනුස්වාරය සඳහා "පූර්ණ නාසිකය" යන නාම ද යෙදේ.
3. ඌෂ්මාක්ෂර අර්ධ ස්වර ලෙස ද හැඳින්වේ.
4. ස්වර අක්ෂරවලට තනිව සිටිය නොහැකිය.

(09)
1. ක, ඛ, ග, ඝ අක්ෂර මූර්ධජ අක්ෂර යි.
2. ඟ, ඦ, ඬ, ඳ, ඣ සඤ්ඤක අක්ෂර යි.
3. ශ, ෂ, ස, හ, ඌෂ්මාක්ෂරයි.
4. ය, ර , ල, ඛ, ඣ අර්ධ ස්වරයි.

(10) අඝෝෂ අක්ෂර පමණක් යෙදුණු වරණය වන්නේ,
1. ඟ, ඦ, ඬ, ඳ, ඹ.
2. ස, ඣ, ඪ, ධ, හ
3. ක, ඛ, ච, ඡ, ට, ඨ, ත, ථ
4. ශ-ෂ, ස-ෆ, ප-ඵ, ග-ඝ

*** 11 හා 12 ප්‍රශ්නවල අක්ෂර නිවැරදිව යෙදී ඇති වචන ඇතුළත් වරණය තෝරන්න.**

(11)
1. කථා, සාම්ප්‍රදායානුකූල, ප්‍රසංගික, ප්‍රත්‍යාර්ථ
2. ව්‍යංග්‍යාර්ථ, අත්‍යවශ්‍ය, ඓතිහාසික, ප්‍රත්‍යයාර්ථ
3. රිද්මානුකූල, විද්‍යුත්, ව්‍යංග්‍යාර්ථ, අවස්ථාවෝචිත
4. විද්‍යාමාන, සාමාර්ථ්‍යය , අමාත්‍යාංශය, ප්‍රත්‍යාර්ථ

(12)
1. කුරුළු, කුකුලු, මහලු, මලු
2. අලුයම, කුරුලු, කුකුළු, සිත්කළු
3. කළුලැල්ල, මහළු, රතුළුනු, ගාළු පාර
4. කැලණි, කුරුලු , මහලු, අලුයම

(13) පහත වචනවල යටින් ඉරිඇඳි පිල්ලම් නිවැරදිව පිළිවෙළින් නම්කරන ලද වරණය තෝරන්න.
කරුණාව, කර්මය, රුහැන, කෘමිනාශක, වාක්‍ය

1. රේඵය, ඇදපිල්ල, පාපිල්ල, ගැටපිල්ල, යංශය
2. කෙටි ඇදය, රේඵය , පාපිල්ල, ගැටපිල්ල, යංශය
3. පාපිල්ල, රේඵය , කෙටිඇදය, ගැටය සහිත ඇලපිල්ල, යංශය
4. පාපිල්ල, රකාරාංශය, කෙටිඇදය, ඇලපිල්ල, යංශය

(14) දී ඇති වචන ගොනු අතරින් අන්‍යෝන්‍ය වශයෙන් ළං වන කාර්යයන් සමඟ බැඳී නොපවත්නා පද පේළිය සොයන්න.

1. ශාන්තිකර්ම, සිවුදේවාල, හොරණෑකරු, රත්දෝලිය
2. උපමා, රූපක, ස්වභාවෝක්තිය, අතිශයෝක්තිය
3. රුහැන, කොඩිය, කොම්බුව, පාපිල්ල
4. පිලේ පැදුර, ගී සීපද, රුතිස් පැයේ, හැන්නදි රාල

**හිස්තැනට සුදුසු පිළිතුර තෝරන්න.**

(15) අම්මාගේ අවවාදයෙන් පසු නංගීගේ ඉකිබිඳුම ඇසෙන්නට .................... .
1. වූවාය 2. විය 3. වූහ 4. වෙති

(16) දියණි තොමෝ හෙට විදේශගත .................... .
1. වූහ 2. වෙයි 3. වූවාය 4. වෙති

(17) ......... වැරදි කරන්නේ ඇයි?
1. ළමයි 2. ළමයින් 3. ළමෝ 4. ළමා පිරිස

(18) ......... අපව නසති.
1. කෙනෙකු 2. කෙනෙක් 3. අයෙකු 4. අය

*** විවිධ ප්‍රදේශයන් හා රැකියාවන්ට අයත් මෙම වචන සඳහා යෙදෙන අර්ථ නිවැරදිව දක්වෙන පිළිතුරු කුමක්ද?**

(19) සුම්බරේ, වයිතාලය, ගඟුල බානවා, හේමලයා, යතුර

1. කරදරය, හන්දිය, තේ වතුර බොනවා, මල්ලී, අගුල
2. මහන්සිය, උදය, ගංගාව ගලනවා, පිළිකුල, කුල්ල
3. ජටාව, උදෑසන, වැස්ස, හෙවණැල්ල, කුල්ල
4. ජටාව, කරදරය , තේ කහට, හෙවණැල්ල, පැදුර

(20) විවාහවීම, වැහි කබාය, සෙරෙප්පු, නොවටිනා ගල්, බැවුම

1. පාවරවීම, එල්ලංගාව, වාංපතුල්, කට්ටකෑලි, පල්ලම
2. පැල්ගැහීම, ජම්පර කළුව, වාංපතුල්, සන්නම්, එල්ලංගාව
3. සරණය, කෝඩුව, වාංපතුල්, ඔපයං, පල්ලම
4. මංගල්‍යය, වැසි ඇඳුම , වාංපතුල්, මායියා, තැනිතලාව

*** මුද්‍රිත කොටස් කවර ව්‍යාකරණ වර්ගයට අයත්දැයි තෝරන්න.**

(21) බැල මෙහෙවර සඳහා කුඩා ළමයින් යොදා ගැනීම දඬුවම් ලබන වරදකි.

1. උපසර්ග
2. නිපාත
3. විශේෂණ පද
4. සමාස

*** පහත වාක්‍යයේ කළු අකුරින් දැක්වෙන පදය කුමන සමාසයකට අයත්ද?**

(22) **දෙව්බඹසුරනා** සේනා සාධුකාර දී බුදුන් වැන්දහ.

1. අන්‍යාර්ථ සමාස
2. අව්‍ය සමාස
3. ද්කාරාර්ථ සමාස
4. විභක්ති සමාස

*** පහත වාක්‍යයේ කළු අකුරින් දැක්වෙන පදය අයත් විභක්තිය වන්නේ,**

(23) ස්ත්‍රීහු අලංකාර **විලාසිතාවන්ට** කැමැත්තක් දක්වති.

1. කරණ විභක්තිය
2. සම්ප්‍රදාන විභක්තිය
3. අවධි විභක්තිය
4. සම්බන්ධ විභක්තිය

(24) **බුද්ධිමත්** ශිෂ්‍යයා **දක්ෂතම** ලෙස විභාගය ජය ගත්තේ ය.
ඉහත වාක්‍යයේ ඉරි ඇඳි පද අයත් වියරණ වර්ගය කුමක්ද?

1. කෘදන්ත
2. නිපාත
3. තද්ධිත
4. විභක්ති

(25) **කියන්නා** කෙසේ කීවත් **අසන්නා** සිහි බුද්ධියෙන් ඇසිය යුතු ය.
යනු අපේ පැරණි කියමනකි. මෙහි ඉරි ඇඳි පද අයත් වියරණ වර්ගය කුමක්ද?

1. විභක්ති
2. සමාස
3. කෘදන්ත
4. ක්‍රියා පද

(26) පද දෙක ම නිවැරදි ව විසන්ධි කර නැති පිළිතුර තෝරන්න.

1. සුර + ඉඳු, අති + අවශ්‍ය
2. නෙත + අග, මහි + යංගත
3. කුඩා + අම්මා, වල් + ඌරා
4. නියඟ + සාය, වට + උර

(27) පහත පද අයත් සන්ධි නාම නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
කටුවල, පිළිතුරු, උනුන්, නෙළුම්මල

1. පූර්ව ස්වර ලෝප සන්ධිය, පරස්වරලෝප සන්ධිය, ආගම සන්ධිය, ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය
2. ආගම සන්ධිය, ස්වර සන්ධි, පූර්වස්වරලෝප සන්ධිය, පරරූප සන්ධිය
3. ආගම සන්ධිය, පරස්වරලෝප සන්ධිය, ස්වර සන්ධිය, ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය
4. පූර්වස්වරලෝප සන්ධිය, පරස්වරලෝප සන්ධිය, ස්වර සන්ධිය, ආගම සන්ධිය

(28) අන්‍යාර්ථ සමාසයට අයත් පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.

1. ඉරහඳතරු, දසබල, උපගුරු, සියපත, ගිනිබිය
2. තුන්බිය, සඳවත, සරාසඳ, ගුණසයුර, නිල්මහනෙල්
3. යාවජීව, අනුබල, සුමිහිරි, කුකවි, අප්‍රමාණ
4. තිනෙත්, මලවි, සුන්තුරු, බස්නාහිර, දසබල

අ.පි.බ.

*** 29 හා 30 ප්‍රශ්නවල කළු අකුරින් මුද්‍රිත කොටස් වෙනුවට යෙදිය හැකි වඩාත් ගැළපෙන තනිපදය තෝරන්න.**

(29) රැයිපියෙල් තෙන්නකෝන් මහතා **පද දහතරකින් යුත්** සැහැලි කාව්‍ය ලිවීමට ප්‍රසිද්ධියක් ඉසිලුවේය.

1. තෙලෙස් 2. සොළොස්
3. තුදුස් 4. අටලොස්

(30) **වර්තමානයට අයත්** තරුණ පරපුර කියවීමේ පුරුද්ද ඉවත ලා ඇත්තේ ජංගම දුරකථන භාවිතය නිසාය.

1. චිරන්තන 2. අද්‍යතන
3. පැරණිතම 4. ප්‍රාචීන

*** පහත 31 සිට 34 දක්වා ප්‍රශ්නවල වාක්‍යයන්හි නිදොස් වාක්‍යය තෝරන්න.**

(31)
1. දෙමාපියන් රැස්වීමට පැමිණෙති'යි සිසුහු පැවසූහ.
2. දෙමාපියන් රැස්වීමට පැමිණියෝ'යි සිසුහු පැවසූහ.
3. දෙමාපියෝ රැස්වීමට පැමිණෙති'යි සිසුහු පැවසූහ.
4. දෙමාපියෝ රැස්වීමට පැමිණියහ'යි සිසුහු පැවසූහ.

(32)
1. පාසල් සංවර්ධන සමිතියට ගුරුවරුන් ද දෙමාපියන් ද පැමිණියහ.
2. පාසල් සංවර්ධන සමිතියට ගුරුවරු ද දෙමාපියන් ද පැමිණියහ.
3. පාසල් සංවර්ධන සමිතියට ගුරුවරුන් හා දෙමාපියන් ද පැමිණියහ.
4. පාසල් සංවර්ධන සමිතියට ගුරුවරු ද දෙමව්පියෝ ද පැමිණියහ.

(33)
1. ඈ සුරඟනක මෙන් සැරසී පැමිණියාය.
2. ඈ සුරඟනක් මෙන් සැරසී පැමිණියාය.
3. ඇය සුරඟනක් මෙන් සැරසී පැමිණෙන ලදී.
4. ඈ සුරඟනක මෙන් සැරසී පැමිණියහ.

(34)
1. සමුළුවට නියෝජිතයින් පැමිණ ඇත.
2. සිවුපාවෝ කුරුල්ලෝ හා වනය අත්හැර යනු ඇත.
3. පන්තියේ ළමයින් ඇත.
4. අපි යෝධයෝ සේ නැගිටිය යුතු බව පැවසුවෙමු.

(35) පහත (අ), (ආ) කොටස් යටතේ දැක්වෙන නම් හා එමගින් සැදී ඇති සංඛ්‍යා වඩාත් නිවැරදි ලෙස එකිනෙකට ගැළපෙන වරණය වන්නේ,

| | | | |
|---|---|---|---|
| A | පසළොස් | -E | -64 |
| B | සූසැට | -F | -16 |
| C | තුන්තිස් | -G | -14 |
| D | තුදුස | -H | -30 |

1. A F ය. 2. B E ය.
3. D E ය. 4. C H ය.



අ.පි.බ.

(36) පහත දැක්වෙන අක්ෂර ගැළපීමෙන් සූචනය වන වැරදියට යෙදූ පුරාතන කෘතිය නම් කරන්න.

1. රවමාඅකු
2. යජාරායලිව
3. කයබසිරස්ල
4. එසිකණවිම්

(37) "හබලට ඔබේ සව්බල අත රිදෙනවද
ඔරු කඳ උඩින් දළ රළ පෙළ නගිනවද "
ඉහත කවි පද අයත් කවි පන්තිය රචනා කළේ කවුද?

1. මහගමසේකරයන්
2. කේයස්
3. විමල් දිසානායකයන්
4. කුමරතුඟුවන්

(38) " පැසෙයි තිබඳ සුවඳැල් කෙත්වත් අවට
ඇසෙයි ළමා වසු පැටියන් හඬ දුරට"
මෙම කවි පද අයත් සන්දේශ කාව්‍ය වන්නේ කුමක්ද?

1. සැළලිහිණි සංදේශය
2. ගිරා සංදේශය
3. හංස සංදේශය
4. පරෙවි සංදේශය

(39) "දුදනොද බිඳ
ඔද තෙද කඳ
කඳ දෙවි රද සාමිනේ......"
මෙම කවියෙහි ඇතුළත් කාව්‍යෝක්තිය වන්නේ,

1. අනුප්‍රාසය
2. උපමා
3. අතිශයෝක්තිය
4. රූපක

(40) හිස්තැනට සුදුසු පද ඇතුළත් වරණය තෝරන්න.

i. ........... වෙහෙර දිස්වේ සුර විමනක් ලෙසට.
ii. සුර ලඳුන් නෙතගින් සභාව දෙස බලයි. මම් .......... එය පවසම්ද?
iii. පෙරදිග ගොරහැඩි රකුසෝ .......... මගෙ ධ්‍යානය කඩන්නෙ.
iv. පෙර මග නැකතට වැඩිය ...... සුබ නිමිති.

E – බල F – එහි G – ඇයි H - කෙසේ

1. F E G H
2. F H G E
3. H G F E
4. H F E G

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்புக்கல்விவலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

# දෙවන වාර ඇගයීම- 2016
# இரண்டாம் தவணைமதிப்பீடு - 2016
# Second Term Evaluation -2016

| | | |
|---|---|---|
| 11ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 | සිංහල භාෂාව හා සාහිත්‍යය11 පත්‍රය<br>சிங்கள மொழியும் இலக்கியமும்வினாத்தாள் -11<br>Sinhala Language & Literature Paper 11 | පැය දෙකයි<br>இரண்டுமணித்தியாலங்கள்<br>Two Hours |

සැලකිය යුතුයි :-

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- මෙම පත්‍රය සඳහා ලකුණු 80ක් හිමි වේ.

**(01) ප්‍රශ්නයේ 1 සිට 10 තෙක් ඇති සියලු ම අනුකොටස්වලට උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(01) i. " ත ථ ද ධ න ඳ " අක්ෂර කාණ්ඩය ඇතුළත් වර්ගය නම් කරන්න.

ii. ක් + අ + ල් + අ + ස් + අ - "කලස" ලෙසට යෙදේ නම්,
අ) "නුවණෙන් "
ආ) "දරුවා" යන වචන දෙකෙහි ස්වර හා ව්‍යඤ්ජන වෙන් කර ලියන්න.

iii. අ) මෙම කර්තෘ කාරක වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.
නළුවෝ අපූරු රංගනයක් ඉදිරිපත් කරමින් ප්‍රේක්ෂකයන් පිනවූහ.

ආ) මෙම කර්ම කාරක වාක්‍ය කර්තෘ කාරකයට හරවා ලියන්න.
නිළියක විසින් අපූරු රංගනයක් ඉදිරිපත් කෙරිණි.

iv. පහත වාක්‍ය සදෙස් නම් නිදෙස් කරන්න.
අ) මම සමඟ නුඹ පණිවිඩය ගෙන යන්නෙමි.
ආ)සාගරය නොහොත් සමුද්‍ර අපගේ ප්‍රෝටීන අවශ්‍යතාව සපුරා දෙන්නීය.

v. පහත වචනවලට අර්ථය වැඩිකරන උපසර්ග පද යොදන්න.
(i) වර්ධන (ii) දන (iii) නිල් (iv) බල

vi. අ) දරුවන්ට, ගවේෂණයට යන පදවල නාම ප්‍රකෘති හා ප්‍රත්‍ය වෙන් කරන්න.
ආ) " වැපිරුවේය ", " ලියූහ" යන පදවල ධාතු ප්‍රකෘති වෙන් කරන්න.

vii. ඉරි ඇඳි පදවල විභක්ති නම් කරන්න.
අ) මම <u>තාත්තාට</u> කුඩය අල්ලමි.
ආ)උයන පිපුණු <u>**මල්වලින්**</u> අලංකාර වේ.

viii. අ) පහත පද තද්ධිත හා කෘදන්ත යන දෙවර්ගයට බෙදන්න.
බලන්නා, ප්‍රවීණත්ව, ගැයුම්, සෞන්දර්යය
ආ) ඒවායෙහි ප්‍රකෘති හා ප්‍රත්‍යය වෙන් කරන්න.

ix. මෙම උපභාෂාවල පොදු ව්‍යවහාරය ලියන්න.
අ) පන්න කරනවා ආ) අලුයම් පොළ

x. පහත සන්ධි පද විසන්ධි කර දක්වන්න.
අ) නිලුපුල් , කොග්ගල
ආ) පහත පද සමාස කොට ලියන්න.
සරත් කාලයෙහි සඳ -
උචිත භාවයක් නැත්තේ - 175

(ලකුණු 2X10=20)

අ.පි.බ.

(02) පහත දැක්වෙන අ, ආ, ඉ, ඊ යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. ඒ සඳහා සුදුසු මාතෘකාවක් ද යොදන්න.

* අන්තර්ගත විය යුතු කරුණු
* ඡේද සංඛ්‍යාව
* කරුණු පෙළ ගැස්වීමේ දී අනුගමනය කළ හැකි ක්‍රියා පිළිවෙළ
* යොදා ගත හැකි මාතෘකාව ආදිය පිළිබඳ මඟ පෙන්වීමක් අදාළ විස්තරය ඇසුරෙන් ලබා ගන්න.

(අ) අතීත ශ්‍රී ලංකාව හරිත වර්ණයෙන් බැබළුණු සෞම්‍ය දේශගුණයෙන් යුත් දූපතකි. ගංගා ඇළදොළ මිටියාවත්වලින් සමලංකෘත විය. සුවදායක පරිසරයක ගහකොළ ද මිනිසා ද සත්තු ද ජීවිතය ගෙන ගියහ. ක්‍රමයෙන් ශ්‍රී ලංකාව තාක්ෂණික දියුණුවක් අත්පත් කරගෙන ඇත. ධරණීතල සංකල්පය හරහා දියුණුවට ළඟාවූයේ නම් මෙතුරම් දැඩි වායුගෝලීය උණුසුමකට ලක් නොවනු ඇත. ජල ගැලීම්, නාය යෑම් අපට උරුම නොවනු ඇත. ඉදිරියට ද මේ තත්ත්වය වැඩිවීම නොඅනුමාන ය. මෙයට පිළියම් සෙවිය යුත්තේද අපම ය.

(ආ) ආර්ථික සංවර්ධනයට දායක වීම, තම වෘත්තීය ළැදියා හා අභියෝග හඳුනා ගැනීම, හැකියාවට සරිලන රැකියාව තෝරා ගැනීම, වාසිදායක ජීවනෝපායක යෙදීම ආදිය සඳහා සුදුසු වන අනාගත පුරවැසියෙකු ලෙස ඔබ අද අද ම ළඟා කර ගත යුතු නිපුණතා රැසකි. එහෙත් ශිෂ්‍ය පරපුර අරමුණකින් තොරව කටයුතු කරනු දැකිය හැකි ය. අනාගත ඉලක්ක ජයගෙන ජීවිත ගමන සාර්ථක කරගත යුතු ය. එහෙත් එය එතරම් පහසු ද නොවේ. අපහසු ද නැත.

(ඉ) සාහිත්‍ය ජනතා උරුමයකි. නිර්මාණාත්මක සාහිත්‍ය තුළින් මිනිසා යහපත් අයෙකු බවට පත් කරවයි. යහපත් ආකල්ප වඩවයි. මේ ප්‍රබල ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණ අප අතරට එක්වෙමින් පවතින යුගයකි. එහෙත් මිනිසාගේ සාමකාමිත්වයට වඩා අද දැකිය හැකිවන්නේ අඩ දබරයි. තරක සිතුවිලියි. මෙවන් තත්ත්වයකින් මිනිසා මුදවා ගැනීමට සාහිත්‍යය ප්‍රබල මෙහෙවරක යෙදිය යුතුය.

(ඊ) අතීත මුතුන් මිත්තෝ තම ගෙවත්තේ ම අල, බතල වගා කළහ. වත්තෙන් සොයා ගන්නා කොස්, දෙල් අනුභව කළහ. පලතුරු හා පළා වර්ග ද වවා ආහාරයට ගත්හ. ඔවුහු නිරෝගී අය වූහ. වැව් තැනූහ. දාගැබ් ගොඩනැංවූහ. එහෙත් වර්තමාන මිනිසාගේ ආහාරය වස විසෙන් අනූන ය. අද මිනිසා අවිවේකී බව හේතුවක් කොටගෙන ක්ෂණික ආහාරයට පුරුදු ව සිටියි. සුවකළ නොහැකි රෝගී තත්ත්වයන්ගෙන් දිනෙන් දිනම මිනිසා පෙළෙයි. සෞඛ්‍ය තත්ත්වය පිරිහී ගොස් ය. මේ සඳහා කළ යුත්තේ කුමක් ද? මෙයින් මිදිය හැක්කේ කෙසේ ද?

(ලකුණු 25)

(03) පහත දැක්වෙන ඡේදය වචන 50-55ක් අතර ගණනකින් යුතු වන සේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශයේ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

උතුරු මැද පළාතේ ප්‍රධාන නගරය වන අනුරාධපුරය අවුරුදු 1500ක් පමණ ශ්‍රී ලංකාවේ අගනුවර වශයෙන් පැවතිණි. පණ්ඩුකාභය රජුගේ සිට මිහිඳු රජු තෙක් රජුන් සියයකට අධික සංඛ්‍යාවකගේ විජය භූමිය වූ අනුරාධපුරය අපේ සංස්කෘතියේ තෝතැන්න බඳු වෙයි. මිහිඳු මහ රහතන් වහන්සේ විසින් මෙරටට බුද්ධාගම ගෙන එන ලද්දේ අනුරපුර රජ කළ දෙවන පැතිස් රජුගේ රාජ්‍ය කාලයේදී ය. ඊට ටික කලකට පසුව සංඝමිත්තා මෙහෙණින් වහන්සේ විසින් ගෙනෙන ලද ශ්‍රී මහා බෝධි ශාඛාව රෝපණය කරන ලද්දේ ද අනුරපුර මහමෙව්නා උයනේ ය. අප රටේ මුලින් ම තනන ලද විහාරස්ථාන සියල්ලේ ම පාහේ බෝධි ශාඛා රෝපණය කරන ලද්දේ ශ්‍රී මහා බෝධියේ අංකුරවලිනි.

ශ්‍රී මහා බෝධිය ලොව ඉපැරණි ම වෘක්ෂය ලෙස පිළිගැනේ. අපේ රජ කෙනෙකු විසින් තනන ලද මුල් ම චෛත්‍ය ලෙස සැලකෙන ථූපාරාම දාගැබ ද පිහිටා ඇත්තේ අනුරාධපුරයේ ය. එම චෛත්‍යය නිර්මාණය කළ මූලධර්මයට ම අනුව යමින් තැනූ රුවන්වැලිසෑය, අභයගිරිය හා ජේතවනාරාමය වැනි විශාල චෛත්‍යයන් ගොඩ නගා ඇත්තේ ද අනුරාධපුරයේ ය. අපේ වාරිකර්මාන්ත ශිල්පයේ ආරම්භය වූයේ ද අනුරාධපුරයයි. අද බසවක්කුලම නමින් හැඳින්වෙන අභය වැව මෙරට තනන ලද මුල් ම වාරිකර්මාන්තය ලෙස සැලකෙන අතර එය පණ්ඩුකාභය රජු විසින් කරවන ලද්දකි. මින් පසුව මහා සාගරය බඳු මින්නේරිය වැව, කන්තලේ වැව ආදී වැව් බැඳවූ මහසෙන්, ධාතුසේන හා II වන අග්බෝ වැනි රජවරු අනුරාධපුරයේ රජකළ අය වූහ.

(ලකුණු 10)



ඈ.පි.බ.

(04) පහත කවි පන්තිය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

රෑ පාණේ තල්ගස්වල පොළට ඇදෙන බර බාගෙක
ලන්තෑරුම් එළිය පෙනී හිත පෑරී හඬන පැයෙක
ඇතුමල් පාලම පසුකොට එදා කියූ සිහිපදයක
දෝංකාර හඬ සිහිනෙත් මෙන් ඇසුණා දුර ඇසෙක

පිරිත පුරන හඬ මතුවෙයි නා ගහ පන්සල පෙදෙසින
බක් මී මල් සුවඳක් ඇල්ලන්ද දිගේ එයි දුවගෙන
බොහෝ ඈත දුර දවසක ඇය හා සුදු මානෙල් ගෙන
ගිය ගමනක මිහිර හිතේ පැටලී කඳුළක් ඉපදෙන

රෑ බස්රිය එදා වගෙම හන්දිය පසුකරන කලට
ඉස්ටෝරුව වැඩ ඇරිලා තාත්තා ඇවිදින් මිදුලට
පුතේ කියා අමතන හඬ යළි කිසිදින් නෑසෙන්නට
සැඟවිලාය පාළු මිදුල මැද කිසිවකු නැත පෙනෙන්ට

1. ඉහත කවි පෙළෙන් ප්‍රකාශ වන්නේ කෙබඳු අත්දැකීමක්ද?
2. කවියාගේ සිතට සතුට ගෙන දුන් සිදුවීම් දෙකක් ලියන්න.
3. ඔහු අද තනිවී ඇති බව පවසන කවි පදය ලියන්න.
4. "අම්මා සිහි වී මුළු ඇඟ රිදී වේදනා ඇවිළෙන" යන යෙදුමෙන් අදහස් වන්නේ කුමක්ද?
5. (i) යළි, හඬන යන පද කුමන වියරණ වර්ගයට අයත්ද?
   (ii) නාම විශේෂණ පදයක් හා ආලපන විභක්තියට අයත් පදයක් ලියන්න. (2x05=10)

(05) අටුලුගම, මහකන්දයාය ප්‍රදේශයේ ඇති පැරණි වෙළඳපොළ වෙනුවට නවීන ක්‍රමයේ මහා වෙළඳ සංකීර්ණයක් ඉදි කිරීමට නාගරික සංවර්ධන සභාව යෝජනා කර ඇත. මෙම වෙළඳ සංකීර්ණය ඉදිකිරීම නිසා ප්‍රදේශයේ ජනතාවට සිදුවන සෙත ද අතිමහත් ය. වෙළඳුන්ට මෙන් ම පාරිභෝගිකයින්ට ද මෙය වැදගත් වේ. මෙම අදහස සළකා බැලූ " පාරිභෝගික සංගමයේ ලේකම් " සිරිජය වික්‍රමගේ මහතා අටුලුගම නගරාධිපතිතුමා වෙත ලිපියක් ලියයි. මෙම වෙළඳ සංකීර්ණය ඉදිකිරීමට තම සංගමයට මෙන්ම වෙළඳ සංගමයටද යම් දයකත්වයක් දැරිය හැකි බවත් වැඩපිළිවෙළ ඉක්මනින් ක්‍රියාවට නංවා දෙන ලෙසත් ඔහු ඉල්ලීම් කරයි.
පාරිභෝගික සංගමයේ ලේකම් සිරිජය වික්‍රමගේ ඔබ යයි සිතා නගරාධිපතිතුමාට යවන ලිපිය සකස් කරන්න.(වචන 100ක් පමණ සෑහේ)

නැතහොත්

ඔබේ පාසලේ පැවති ක්‍රීඩා උත්සවය පිළිබඳ පහත තොරතුරු ඇසුරින් පුවත්පතකට සුදුසු වාර්තාවක් සපයන්න. වචන 100ක් පමණ සෑහේ.

- 2016 මාර්තු 18 දින සවස 2.00ට ආරම්භ විය. විශේෂ අමුත්තා වූයේ පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂතුමා ය.
- මීටර 200 ධාවන තරගයෙන් සුවිශේෂ වාර්තාවක් මලල ක්‍රීඩක ඒ.අකලංක ශිෂ්‍යයා විසින් පිහිටුවන ලදී.
- නීරෝගී දරුවන් බිහිවන්නේ පාසලේ ක්‍රීඩා පිටියෙන් බවත්, ක්‍රීඩාව නිසා ගත සිත සමබර පෞරුෂයකින් වඩවා ගත හැකි බවත් අධ්‍යක්ෂතුමාගේ, කතාවේ දී ප්‍රකාශ කර සිටියේය.
- ගුරුවරුන්, සිසුන් , දෙමාපියන් , විශේෂ ආරාධිතයන්, සුබපතන්නන් සහ ආදී සිසු සිසුවියන් රාශියකගේ සහභාගිත්වයෙන් මෙය පැවැත්වුණි.

(ලකුණු 15)

177

සියලු ම හිමිකම් ඇවිරිණි ]
முழுப் பதிப்புரிமையுடையது ]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்புக் கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணைமதிப்பீடு - 2016
Second Term Evaluation -

| | | |
|---|---|---|
| 11ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 | සිංහල භාෂාව හා සාහිත්‍යය111පත්‍රය<br>சிங்கள மொழியும் இலக்கியமும்வினாத்தாள் -111<br>Sinhala Language & Literature Paper 111 | පැය දෙකයි<br>இரண்டுமணித்தியாலங்கள்<br>Two Hours |

සැලකිය යුතුයි :-

- 1,2,3,4 ප්‍රශ්නවලටත් 5,6,7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු ගණන 80කි.
- පළමු ප්‍රශ්නයේ (i) සිට (x) තෙක් සියලු ම අනුකොටස්වලට කෙටි පිළිතුරු ලියන්න. ඔබ එසේ නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(01) (i) "ජාතිය රන් විමනක් වේ
ආගම මිණි පහනක් වේ"

(අ) මෙම පද්‍ය පාඨය උපුටාගත් කාව්‍ය පන්තියෙහි රචකයා නම් කරන්න.
(ආ) පද්‍ය පාඨය අයත් කාව්‍ය ග්‍රන්ථය නම් කරන්න.

(ii) ...........................................................................
පිළිමල් දපද සින්දේ
...........................................................................
විජය සිරි සඳ ගෙන වැලැන්දේ

(අ) ඉහත පද්‍යය සම්පූර්ණ කරන්න.
(ආ) මෙම කවියෙහි දෙවන පදයෙහි අර්ථය ලියන්න.

(iii) " මගේ හේන වපුරලා දන් හරියට මාසයයි. කවුරුත් අහලා තියෙනවාද අවුරුද්ද පහුවෙලා මාස පහක් ගිහින් හේනක් වපුරන බවක්"

(අ) මේ කතාබහ කුමන සිදුවීමක් මුල් කරගෙන සිදු වූයේ ද?
(ආ) මෙම පාඨය උපුටාගත් කෘතියේ මුල් කෘතිය කුමක් ද?

(iv) "නොමියන හේළි දහමක පණිවුඩය පිට
කොඳුරම් කෙඳිරියක් මුළු ලොව තිසල කොට"

(අ) " හේළි දහම " යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?
(ආ) පද්‍ය පන්තියේ කතුවරයාගේ වෙනත් කාව්‍ය කෘතියක් නම් කරන්න.

(v) " ම දුව විකුණන්නා නැත. රන් හැර ගෙන නොදෙමි. අපටත් රක්ෂාව නම් ඌම වෙද?...."

(අ) මේ පාඨය ඇතුළත් පාඩම උපුටාගත් කෘතිය කුමක් ද?
(ආ) මෙම දුවගේ හා පියාගේ රක්ෂාව වූයේ කුමක් ද?

(vi) (අ) හංස සංදේශයේ කතුවරයා රචනා කරන ලද වෙනත් ග්‍රන්ථයක් සඳහන් කරන්න.
(ආ) මෙම සංදේශය රචනා කිරීමේ අරමුණ ලියන්න.

අ.පි.බ.

(vii) (අ) "උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව" පාඩමේ අවසානයේ දක්වා ඇති ධර්ම පණිවුඩය ලියා දක්වන්න.

(ආ) මෙම පාඩම උපුටාගත් මුල් කෘතිය කුමක් ද?

(viii) "ප්‍රේමවන්ත දරුවෙනි මා
හිඳිනු කන් යොමා
කියමි පුවත සැක දුරැරා
අසන නිතියෙනා"

සුප්පා දේවිය දරුවන්ට කීමට සූදානම් වන පුවත කුමක් ද?

(ix) පහත සඳහන් කෘතිවල රචකයන් නම් කරන්න.

(අ) කල්පනා ලෝකය

(ආ) කව්මිණ

(x) "සැවැත් නුවරින් නික්ම සොරු කෙරෙ බිරි සිතින් නොයාටි වුයෙද"

(අ) මෙසේ සිතූ අය ඉන් අනතුරුව ගියේ කුමන ස්ථානයකට ද?

(ආ) මේ කියමන උපුටාගත් කෘතියේ කතුවරයා කවුරුන් ද? (ල.2x10 =20)

(02) පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) "රැති වත පෙති නැවිදින් **<u>සුමුවෝයා</u>**
නිති මියුරැති වෙණ **<u>නදළමුවෝයා</u>**
සිතිවිලි නැකි රූ විලස මුවෝයා
තැති නොගනිති මිනිසුන් සමුවෝයා"

(අ) මෙම කවියෙහි සඳහන් සත්ත්ව කොට්ඨාසය කවුරුන් ද? ඔවුන්ගේ හැසිරීම කෙබඳුද යන්න කෙටියෙන් ලියන්න.

(ආ) ඉරි ඇඳි පදවලට අර්ථ සපයන්න.

(ii) "දෙව්ලොව දෙවියන් පිරිවරා අසුර යුද්ධයට නික්මුණු සක්දෙව් රජහු පරිද්දෙන් උපමාවිෂයාතික්‍රාන්ත වූ ශ්‍රී සෞභාග්‍යයෙන් යුක්තව අෂ්ටවංක මාණික්‍ය රත්නය අතින් ගෙන කේවට්ටයන් ඉදිරියෙහි ළංව වැඩිසේක."

(අ) මෙසේ පැමිණියේ කවුරුන් ද? පැමිණියේ කුමක් සඳහා ද?

(ආ) ඉන් පසුව එම අවස්ථාවේදී සිදු වූ දෙය කෙටියෙන් ලියන්න.

(iii) "මෙද හේන පැහිලා ඇති කුරක්කන්
රන්වන් කරල් බරවී ඇති සුරක්කන්"

(අ) මෙම කවියෙන් "කුරක්කන් පැසී කරල් බර වී ඇති මහිමය" යන අදහස දෙන පද්‍ය පාඨය තෝරා ලියන්න.

(ආ) ජනකවියෙහි ආරම්භය පිළිබඳව පැරණි ග්‍රන්ථයක දැක්වේ. එම ග්‍රන්ථය හා එය ලියැවුණු යුගය නම්කරන්න.

(iv) "ව න සි රි පියුම්රා බඳ රන'බරණ යුරු
ව ට පි රි සුපුල් දුනුකේ මල් මුරුත'තුරු
බි ගු පි රි වැරූ ඔලු'පුලු'මුලවල තඹුරු
හි ම ස රි සිහිල් දිය හෙබ දක යන් මිතුරු"

(අ) මෙම කවියෙන් සඳහන් කරන්නේ කුමන ප්‍රදේශයක විසිතුරු ද?

(ආ) පළමු පද්‍ය පාද දෙකෙන් කියවෙන අදහස කෙටියෙන් ලියන්න.

අ.පි.බ.

(v) "මිතුරුකමින් පෙරට එතොත්
දූවිල්ලත් එක්ක වුණත්
මිතුරු වෙයන් පුතේ උඹත්
එයයි ලොවේ ගුණය මහත්"

(අ) මෙම කවියෙන් ලබා දෙන උපදේශය කුමක් ද?

(ආ) මෙම කවියේ කටවහර දක්වෙන කවි පදය තෝරා ලියන්න.

(ල.4x5 =20)

(03) (i) අහිංසක මානවකයාගේ මානවීය ගුණ සමුදය මතු කිරීමටත්

(ii) අහිංසක මානවකයා මිනීමරුවකු වීමටත්

යන අවස්ථා දෙක සඳහා ම මූලික වූයේ ඔහු හැදුණු වැඩුණු උගත් සමාජ පරිසරයයි. 'අඟුල්මල් දමනය' පාඩම ඇසුරෙන් එක් කොටසකට උදාහරණ දෙක බැගින් ඉදිරිපත් කරමින් මෙම අදහස සනාථ කරන්න.

(ල.15)

නැතහොත්

(i) පසෙකින් සුමධුර වීණා නාදයකි.

(ii) තවත් පසෙකින් දෙව්ලියෝ අසිරිමත් රංගනයක යෙදෙති.

මේ අවස්ථා ජීවමාන කරමින් ඉදිරිපත් කිරීමට 'ගුත්තිල කාව්‍ය' නිර්මාණකරුවා යොදාගත් කාව්‍යෝක්ති එක් කොටසකට නිදසුන් දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

(ල.15)

(04) සිරි රහල් හිමියන් විසින් සැළලිහිණි සන්දේශයෙන්

(i) තත්කාලීන සමාජ හා ආර්ථික තොරතුරු ද

(ii) චමත්කාරජනක වන පියසක් ද වර්ණනයට ලක් කරයි. නිදසුන් දෙක බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

සිංහබාහු නාටකය මගින් පොදු මිනිස් සබඳතා පිළිබඳ ගැඹුරු ජීවන දර්ශනයක් ගෙන හැරපෑමට,

(i) සුප්පා දේවියගේ දාරක ස්නේහයත්

(ii) සිංහබාහු ලෙන අතහැර යෑමත් යන සිදුවීම් යොදාගෙන ඇත.

මේ පිළිබඳව එක් එක් කරුණට නිදසුන් දෙක බැගින් දක්වමින් පැහැදිලි කිරීමක් කරන්න.

(ල.15)

*** 5,6,7 යන ප්‍රශ්නවලින් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු ලියන්න.**

(05) ගංගාවක ගමන් මග සජීවී ආකාරයෙන් ඉදිරිපත් කරමින් කුඩලිගම කවියා අපූරු ජීවන දර්ශනයක් මතු කරයි. නිදසුන් තුනක් දක්වමින් මේ කියමන සාකච්ඡා කරන්න.

(06) ශබ්ද රසය හා අර්ථ රසය මැනවින් සුසංයෝජනය කරමින් විහාරස්ථානය සහ ගම්පියස විචිත්‍ර ලෙස ප්‍රතීයමාන කිරීමට හංස සංදේශ කවියා සමත් වී ඇත. නිදසුන් තුනක් දක්වමින් කියමන පහදන්න.

(07) ශිල්ප ශාස්ත්‍ර නුගත්කම නිසා විඳින්නට සිදුවන දුක්ගැහැට දක්වමින් උග්ගසේන නම් සිටු පුත්හුගේ වස්තුව ශිෂ්‍ය ජීවිතයට ආදර්ශ රැසක් සපයයි. නිදසුන් තුනක් දක්වමින් විමසන්න.

(ල.10)

අ.පි.බ.

180